193
7

وسائل الثبات - سنهالي

# ස්ථිර පැවැත්මට මගපෙන්වීම

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالبديعة
تحت إشراف وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد
ص.ب ٢٤٩٣٢ - الرياض ١١٤٥٦ - هاتف ٤٣٣٠٨٨٨ - فاكس ٤٣٠١١٢٢

**وسائل الثبات**

أعده وترجمه للغة السنهالية :

**شعبة توعية الجاليات في الزلفي**

ح المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالبديعة، ١٤٢٨هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

شعبة توعية الجاليات في الزلفي

وسائل الثبات.-الرياض، ١٤٢٨هـ

٤٠ ص ، ١٢ × ١٧ سم

ردمك : ٢-٩-٩٩٩٦-٩٩٦٠-٩٧٨

(النص باللغة السنهاليه)

١- الوعظ والإرشاد أ- العنوان

ديوي ٢١٣ ١٤٢٨/٦٣٤١

رقم الإيداع : ١٤٢٨/٦٣٤١

ردمك : ٢-٩-٩٩٩٦-٩٩٦٠-٩٧٨

الصف والإخراج: **شعبة توعية الجاليات في الزلفي**

# وسائل الثبات
# ස්ථිර පැවැත්මට මගපෙන්වීම්

නියතව සියළු ප්‍රශංසා අල්ලාහ්ටමය. අපි ඔහුව ප්‍රශංසා කරමු. ඔහුගෙන්ම උදවු පතමු. ඔහුගෙන්ම සමාව අයදිමු. අපගේ කාර්යයන් ඔහු මත පවරා විශ්වාසය තබමු. අප ආත්මයට කළාවූ අයහපත් දේයින් අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතමු. අපගේ ක්‍රියාවල අයහපත් භාවයෙන්ද ආරක්ෂාව පතමු. අල්ලාහ් කවරෙකුට යහමග පෙන්වන්නේද, ඔහුව කවුරුන් නොමග යැවීමට බැරිය. කවරෙකු ඔහු නොමගෙහි යවන්නේද, ඔහුව යහමග යැවීමටද කිසිවෙකුට බැරිය.

අල්ලාහ් හැර නැමදුමට සුදුසු වෙනත් කවරෙකු හෝ නොමැති බව අප සාක්ෂි දරමු. තවද, ඔහු තනි කෙනෙකු බවද ඔහුට සමානව කිසිවෙකු නොමැති බවද, නියතව, නබිනායක මුහම්මදු (සල්) තුමා ඔහුගේ වහලා හා ඔහුගේ දූතයා බවද අප සාක්ෂි දරමු.

සැබෑ විශ්වාස වන්තයාගේ උතුම් කාර්ය හා ඉමහත් තේරීම ඔහු සිය දහමෙහි ස්ථිර පැවැත්මෙන් සිටීම සහ නබිනායක මුහම්මදු (සල්) තුමාගේ සත් ගුණාධර්ම රැක වල්දී පිළිපැදීමවේ. ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමෙහි කිසියම් කලබලවීමකින් තොරව හා හදිසියෙන් මතු වන සැකයකින් හෝ මැඩ පැවැත්විය නොහැකි ලිංගික හැඟීමකින් හෝ පැතිර පවතින කලහයකින් හෝ ඉවත්වීමෙන් තොරව එතුමාව අනුගමනය කළ යුතුයි. මක්නිසාද,

සත්‍යය හා අසත්‍යය අතර කලබලවීම හා නබිනායක තුමාගේ සුන්නා සංකල්පය විශ්වාස කළ පසු එය අතහැරීම විශ්වාස වන්තයින්ගේ කාර්යයක් නොවන්නේය. එය අවස්ථාවාදීන්ගේ හා අවිශ්වාස වන්තයින්ගේ කාර්යයකි. මවුන් මවුන්ගේ කියමන් හා ප්‍රකාශ අතර වෙනස්කම් කරන්නන් හා අනෙකුත් අවස්ථාවල සිය කටයුතුවල විකෘති කරන්නන් බව කුර්ආනයෙහි සඳහන්වේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

තවද, (ස්ථිර පැවැත්මෙන් තොරව සැකයෙහි) මුදුනෙන් සිට අල්ලාහ්ට වන්දනාමාන කරන්නාද මිනිසුන් අතර සිටී. එහෙයින්, ඔහුට යම් යහපතක් සිදුවූයේනම් ඒ ගැන ඔහු තෘප්තිමත්වේ. ඔහුට යම් කරදරයක් සිදුවූයේනම්, ඔහු සිය මුහුණ මත (විශ්වාසය අතහැර දේව ප්‍රතික්ෂේප කිරීම කරා) පෙරළා සිටී. (මෙවැන්නා) මෙලොවෙහිද පරලොවෙහි ද අලාභයට පත් විය. පැහැදිලි අලාභය නම් මෙයමයවේ.
(අල්කුර්ආන් - 22:11)

සැබෑ මාර්ගය අනුගමනය කිරීම හා එහි ස්ථිර පැවැත්මෙන් සිටීම විශ්වාස වන්තයෙක් අනුගමනය කළ යුතු හා ක්‍රියාකළ යුතු වැදගත් කාර්යයවේ. මේ කරුණු දෙක මිනිසාට ලැබෙන ආශිර්වාදයන් ලෙස ඒවාට තුති පුදකළ යුතු උතුම් දායාදයන්ය. අනුගමනය කිරීම යනු, අල්ලාහ්ට කීකරුවීම, ඔහු අණ කළ අනිවාර්ය කාර්යයන් ඉටු කිරීම, ඔහු තහනම් කළ කාර්යයන්ගෙන් ඈත්වීම සහ මෙවාහි ස්ථිර පැවැත්මෙන් සිටීම වේ.

සුෆ්යාන් ඉබ්නු අබ්දුල්ලාහ් අස්සකෆී (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

මා නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔබතුමාගෙන් හැර අන් කවරෙකුගෙන් හෝ නොවිමසිය යුතු ඉස්ලාමිහි ඇති (වැදගත්) කරුණක් ගැන මාහට කියා දෙන්න' යැයි විමසීමි. එයට එතුමා 'ආමන්තු බිල්ලාහි (මා අල්ලාහ් කෙරෙහි විශ්වාස කළෙමි) යැයි කියා පසුව එම විශ්වාසයෙහි ස්ථිර පැවැත්මෙන් සිටින්න' යනුවෙන් පැවැසීය. (මූලාශ්‍රය : අහ්මද්)

මෙම නබි වදනෙහි නබිතුමා ස්ථිර පැවැත්මෙන් සිටින මෙන් අණ කරන්නේය. කිසියම් වෙනස්කම් කිරීමෙන් හෝ උල්ලංඝනය කිරීමකින් තොරව යහ මගෙහි ගමන් කිරීම ස්ථිර පැවැත්ම යනුවෙන් හැඳින්වේ. පිළිපැදීමෙහි යථාර්ථය මෙයමය. එහෙයින් අල්ලාහ්ගේ දහම අනුව බාහිරව සහ අභ්‍යන්තරව කටයුතු කිරීම අනුගමනය කිරීම යනුවෙන් හැඳින් වේ. පරිපූරණව අනුගමනය කිරීම යනු, ප්‍රතිපත්ති යෙහිද වන්දනාමානවලද ගුණාංගයන්හිද හා හැසිරීමෙහිද අල්ලාහ්ගේ දගම පිළිපැදීමකි. මේවා සියල්ල සිය ජීවිතයේ සියළුම කටයුතුවල එනම්, දේවස්ථානයෙහිද ක්‍රියාවන්හිද වෙළඳ පොළෙහිද හා නිවසෙහිද මේවා අනුගමනය කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

(ඕ : නබි,) ඔබ පවසන්න. සැබැවින්ම, මාගේ සලාතය, මාගේ දන්දීම (කුර්බානිය), මාගේ ජීවිතය, හා මාගේ මර ණය විශ්වාධිපතියාවූ අල්ලාහ්ටම හිමිවේ. ඔහුට කිසියම් සහකරුවෙක් හෝ නැත. මා අණකර ඇත්තේ මෙමගිනි. තවද, (ඔහුට කීකරුවූ) මුස්ලිම්වරු අතර මා පළමුවන්නාය. (අල්කුර්ආන්-6:162,163)

කෙනෙක් තම පාපයන් සඳහා අල්ලාහ්ගෙන් පාපොච්චාරණයකර, ඔහු අණකළ දේ පිළිගෙන අනුගමනය කරන කළ ඔහු එක් ජීවිතයකින් සිට නව ජීවිතයකට පත්වූ බව වටහා ගනී. ඔහු නිශ්ප්‍රයෝජන, අල්ලාහ්ට විරුද්ධව කැරලි ගසන, මංමුළාවට පත් හා පාපයන් පිරි ජීවිතයෙන් සමු ගෙන අල්ලාහ් දෙසට යොමුවිය. එනිසා, ඔහු නව ජීවිතයට ඔබින පරිසරයට සිය හදවත පුරුදු කළ යුතුයි. තම නව ජීවිතයට අදාලව යහපත් වෙනස්කම් ඇති කළ යුතුයි.

මෙවන් පරිසරයේ ඔහු පෙර කියවූ පොත්පත් හා සඟරා වෙනුවෙන් ඉස්ලාමීය පොත්පත් හා සඟරා කියවීමට පටන් ගනී. පෙර සවන්දුන් ගීත හා වෙනත් කැසට් පට වෙනුවෙන් ඉස්ලාමීය කැසට් පට සවන්දීමට පටන් ගනී. දිනපතා ප්‍රමාදවී නින්දට යන ඔහු ෆජ්ර් සලාතයට නැගිටීම සඳහා කල් ඇතිව නින්දට යාමට පටන් ගනී. නොමගෙහි ගමන් කිරීමට සහයවූ මිතුරන් අතහැර යහමගෙහි ගමන් කිරීමට සහය හා උපකාරවන මිතුරන් තෝරා ගනී. මෙසේම සෑම කාර්යයන්හි ඔහු සිය ජීවිතයේ වෙනසක් ඇති කරයි.

අවංකව හා අධිෂ්ඨානගතව ඍජු මාර්ගය අනුගමනය කිරීමට අදහස් කරන සෑම සැබෑ මුස්ලිම් වරයාගේම පද නම අල්ලාහ්ගේ ආගමෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමකි. සමාජයෙහි කලබල වැඩිවන කළ හා මනෝඥ ආශාවන් පෙළඹවීම ව්‍යාප්තවන කළ වැරදි අතට වැටෙන්නන් හා හැරෙන්නන් වැඩිවෙ. මවුනතර සමහරුන් බියෙන්ද තවත් සමහරුන් ආශාවෙන්ද වෙනත් සමහරුන් නොදැනීමෙන්ද වැරදි අතට වැටෙති.

වත්මන් වකවානුවෙ සත්‍යය හා පැහැදිලි දෙය වසංවිය. කලබල වැඩිවිය. මනෝඥ ආශාවන් පොළඹවන කාර්යයන් ව්‍යාප්ත විය. නිශ්පල මාර්ග සරලවිය. මෙලොවෙහි මිථ්‍යා ආශාවන් මිනිස් හදවත් පොළඹවන්නට විය. මෙවන් වකවා නුවෙහි නබිනායක මුහම්මදු (සල්) තුමාගේ ප්‍රියමත් මාර් ගය කරා මගපෙන්වීම කොපමණ අවශ්‍ය ක්‍රියාවක්ද? එය සියළු මංමුළාවෙන් හා නින්දාවෙන් මුස්ලිම් වරයාව රකින මාර්ගයකි. නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්ලාහ්ගේ වහලෙනි, ස්ථිර පැවැත්මෙන් සිටින්න' යනුවෙන් පවසන් නේය. (මුස්ලිම්)

පීඩා හා දුෂ්කරතාවන්ට මුහුණදෙන කළ හා ලොවෙහි මායාවටද එය පොළඹවන කාර්යයන්ටද මුහුණදෙන කළ ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටීම අල්ලාහ්ගේ යහ පත්ශීල දාසයන්ගේ සළකුණකි. මේවා විශ්වාස වන්තයින්ට පරීක්ෂාවක් වශයෙන්ද, නිශ්ඵල හා නොසැළකිලිමත්ව ගමන් කරන්නන්ට පීඩාවක් වශයෙන්ද සිදුවන බව ඔවුහු දැන සිටිති. විශ්වාස වන්තයින්ට සිදුවන පීඩාවන් ඔවුන්ගේ විශ්වාසයට කිසිදු බාධාවක් හෝ ඇති නොකරයි. නමුත්, මෙවන් පීඩාවන් ඔවුන් ගමන් කරන යහමග පිළිබඳව තෘප්තිවීම හා එම මගෙහි ස්ථිර පැවිත්මෙන් සිටීමේ වැද ගත්කම වැඩි කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

අලිෆ් ලාම් මීම්. මිනිසුන් 'අපි විශ්වාස කළෙමු' යනු වෙන් ප්‍රකාශ කිරීමෙන් (පමණක්) ඔවුහු අත්හරිනු ලබන බවත්, ඔවුහු පරීක්ෂාවට ලක්කරනු නොලබන බවත් සිතා ගෙන සිටින්නෝද? ඔවුන්ට පෙර විසූ අයද අපි සැබැවින්ම

පරීක්ෂාවට ලක්කර ඇත්තෙමු. එහෙයින්, (විශ්වාස කළෙමු යැයි පවසන මොවුන් අතර සිටින) සත්‍ය වන්තයින් ගැන අල්ලාහ් නියතව දැන සිටින්නේය. (එසේම මවුනතර සිටින) අසත්‍යවන්තයින් ගැනද අල්ලාහ් නියතව දැන සිටින්නේය.
(අල්කුර්ආන් - 29:1 - 3)

මිනිසා ඍජු මාර්ගයෙහි නොකඩවා ගමන් කිරීම හා එය අනුගමනය කිරීම ස්ථිර පැවැත්ම යනුවෙන් හැඳින්වේ. එසේම ඔහු කුසල් ක්‍රියාවල නොකඩවා යෙදිය යුතුයි. එම කුසල් ක්‍රියාවන් අධිකව ඉටු කිරීමට වෙහෙස දැරිය යුතුයි. පෙර දිනට වඩා අද දිනද, අද දිනට වඩා හෙට දිනද යහපත්ව පවත්වීමට වගබලා ගත යුතුයි. එහෙයින්, සෑම දින යන්ම ඔහුව පරලොව කරා ලඟා කරන්නේය. පොදුවෙන් මිනිසුන් බැලහීන වන්තයින් බැවින් මවුහු සෑම අවස්ථා වෙහිම සිදුවන මිනැම කාර්යයන් කෙරෙහි උනන්දුවෙන් මුහුණ දිය යුතුයි. නමුදු, විශ්වාසවන්තයා සිය හදවත සමඟ සටන් කරයි. යහකම් කාර්යවල නොකඩවා යෙදී සිටින කළ මුහුණ දෙන බාධාවන් ගැන ඉවසීමෙන් සිටී. පරලොව දිනයෙහි ඔහුගේ ජයග්‍රහණයට අදාල කාර්යවල තරඟ වදි මින් නියලී සිටී. අල්ලාහ් මෙසේ පවසන්නේය.

විශ්වාස වන්තයිනි, ඔබලා ඉවසීම වෙළා ගන්න. තවද, (සතුරන් මුහුණ දෙන කළ) එකිනෙකුට ස්ථිරභාවයෙන් සිටින්න. තවද, (සතුරන්ට මුහුණ දී සටන් කිරීම සඳහා) සෑම විටම සීරුවෙන් සිටින්න. අල්ලාහ් කෙරෙහි බියකමින් සිටින්න. ඔබලා (මෙලොවෙහි හා පරලොවෙහි) ජයග්‍රහණ යට පත්වෙති. (අල්කුර්ආන් - 3:200)

(එනිසා, මිනිසුනී) ඔබලාගේ ස්වාමියාගේ සමාව කෙරෙ හිද, ස්වර්ගය කෙරෙහිද ඔබලා තරඟට ගමන් කරන්න. එකී පළල අහස් හා පොළොවෙහි පළලට සමානවේ.

(අල්කුර්ආන්-57:21)

මිනිසා කුමණ බැලහීනතාවයට පත්වුවත්, ඔහුගේ සීමා වට වඩා පහත්වීමට හෝ අඩුවීමට හෝ නොයා වග බලා ගත යුතුයි. ඔහු පාපයක් කිරීමෙන් එකී සීමාවට වඩා පහත්වූයේනම්, එහි රැඳී නොසිට වහාම එයින් මිදී අල්ලාහ් ගෙන් පාපොච්චාරණය කළ යුතුයි.

මානව ජීවිතයේ ස්ථිර පැවැත්මට අදාල විවිධ උදාහරණ කීපයක් අල්කුර්ආනයේ අල්ලාහ් සඳහන් කර ඇත. මෙසේ සඳහන්කර ඇත්තේ මෙමගින් ස්ථිර පැවැත්මෙහි වැදගත් කම මුස්ලිම්වරයා භාගවාගෙන නබිතුමාගේ අනුගාමිකයින් සහ ඔවුන්ට පසු විසුවුවන් වැනි පැරැන්නන්ගේ තත්ත්වයට පත්වීම සඳහා වෙහෙස දැරීම සඳහාය. සමාජයෙහි පහත සඳහන් කාර්ය පිරිහී පවතින බැවින්, මිනිසා ස්ථිර පැවැත් මෙන් සිටීම හා කුසල් ක්‍රියාවන්හි යෙදීම අවශ්‍යවේ.

වත්මන් මුස්ලිම් සමාජය පරිහානියට පත්විය. විවිධාකාර කෝලාහල, ඒවා පොළඹවන කාර්යන්, විවිධාකාර මනෝඥ ආශාවන් හා සැක කිරීම් ඔවුනතර ව්‍යාප්ත වන්නට විය. මෙවන් හේතූන් මත දහම නූතනවූ අතර, ඒවා පිළිපදින් -නන්ද නූතන උදාහරණයක් බවට පත්වූහ. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අනස් ඉබ්නු මාලික් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මිනිසුන් අතර කාලයක් පැමිණේ. (එම කාලයේ) ආගම අනුගමනය කිරීමේදි (මුහුණදෙන අවහිර) ඉවසා සිටින්නා ගිනි අඟුර වෙළා සිටින්නා සේ සිටී.

(මූලාශ්‍රය : තිර්මිදි)

පෙර කාලයේ විසූ සහෝදරයන්ට වඩා අද ජීවත්වන මුස්ලිම්වරුන්ට ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටීම වැදගත් යන්නෙහි බුද්ධිමතුන් අතර කිසියම් සැකයක් හෝ නොමැත. වත්මන් කාලය විනාශට පත්විය. සැබෑ සහෝදරයන් දුර්ලභවූහ. සහයෝගය දක්වන්නන් අඩුවූහ. උපකාර කරන්නන් අසරණවූහ. එහෙයින්, ස්ථිර පැවැත්ම තහවුරු කිරීමට අධික ලෙස වෙහෙස දැරීම අනිවාර්යවෙ.

# ස්ථිර පැවැත්මෙහි මාර්ග

අල්ලාහ්, ඔහුගේ අල්කුර්ආනය මගින්ද, නබිනායක තුමාගේ වදන් හා එතුමාගේ ජීවන චරිතය මගින්ද ආග මෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමට අදාල සියළු මාර්ග පැහැ දිළිකර ඇත. මෙය අල්ලාහ් මානව සමාජයට කළ දයාවකි. ඒවා අතර සමහර මාර්ග මෙසේය :

## 1-කුර්ආනය කරා ළඟාවීම

ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමට අල්කුර්ආනය ප්‍රථම මාර්ගයෙකි. අල්කුර්ආනය වෙළා ගන්නාව අල්ලාහ් ආරක්ෂා කරයි. එය අනුගමනය කරන්නාට ජයග්‍රහණය ලබා දෙයි. එය කරා කැඳවන්නාට අල්ලාහ් ඍජු මාර්ගය පෙන්වයි. මෙම කුර්ආනය ක්‍රමවත්ව හා පැහැදිළිව පහළ

වීමේ අරමුණ, ස්ථීර පැවැත්ම සඳහා බව අල්ලාහ් පවසයි. අවිශ්වාස වන්තයින්ගේ සැක (ප්‍රතික්ෂේප) කිරීමට පිළිතු රක් වශයෙන් අල්ලාහ් මෙසේ පවසන්නේය.

තවද, (මී : නබි,) ප්‍රතික්ෂේප කරුවන් 'ඔහුට මෙම කුර් ආනය (තවරාතය, ඉන්ජීලය හා සබූරය යන ග්‍රන්ථ එකට පහළ කළාක් මෙන් මුළුමනින්ම) එකට පහළ නොකළේ කුමක් නිසාද ?' යනුවෙන් විමසන්නෝය. එසේම, මෙමගින් ඔබේ හදවත ස්ථීරව පැවැතීම සඳහා (මෙය පහළ කළෙමු) තවද, මෙය ක්‍රමක්‍රමයෙන් අපි පාරායනා (කොට පැහැ දිලි) කළෙමු. සත්‍ය හා පැහැදිලි කිරීමෙන් අලංකාරමත් දෙයක් අපි ඔබට ගෙන ඒමෙන් තොරව ඔවුහු ඔබ වෙත කිසියම් උදාහරණයක් හෝ ගෙන ඒමට නොහැක.

(අල්කුර්ආන්-25:32,33)

කුමණ හේතූන් මත අල්කුර්ආනය ස්ථීර පැවැත්මෙහි පදනමක් වන්නේද ?

- එය මිනිස් හදවත්තුල විශ්වාසය වපුරා ඔහුට තම ස්වාමියා කෙරෙහි පවතින සම්බන්ධතාවය ඉතා ශක්තිමත් කරන්නේය.
- අවිශ්වාසීන් හා අවස්ථාවාදීන් වැනි ඉස්ලාමයේ සතුරන් මතුකරන සැක හා ප්‍රශ්නවලට එය පිළිතුරු සපයන් -නේය.
- එය මුස්ලිම් වරයාට යථාර්තය හා සෘජු මඟෙහි ස්ථීර භාවය වටහා දෙන ශක්තිය සහ සැබෑ දැනුම ලබා දෙන්නේය.

## 2-දැනුම :

දැනුම් ඥානයක් නොලබා සිය ජීවිතය ගත කරන්නා අන්ධාකාරයෙහි ගමන් කරන්නෙකු සේය. අන්ධකාරයෙහි ගමන් කරන්නා විවිධ අනතුරුවලට ලක්වෙ. සමහරවිට ඔහු ගමන් කරන මාර්ගයේ පවා යම් අනතුරුවලට ලක් වෙ. නමුදු ඒ ගැන ඔහු නොදනී. එසේම දැනුම් ඥානයක් නොලබා සිය ජීවිතය ගත කරන්නා කාම ආශාවන් හෝ සැක කිරීම් යනාදීන් පොළඹවන කාර්යවලට පහසුවෙන් හසුවෙ. දැනුම් ඥානය ලබා ගන්නා පහත සඳහන් කරුණු රැකවල්දී අනුගමනය කළ යුතුයි.

- ●-අල්ලාහ් වෙනුවෙන් යනු පවිත්‍ර චේතනාව.
- ●-තමතුල පවතින අඥානකම තුරන් කිරීම යනුවෙන් අදිටන්කර ගැනීම.
- ●-සමාජයතුල පවතින අඥානකම තුරන් කිරීම යනුවෙන් අදිටන්කර ගැනීම.
- ●-ඉස්ලාමීය ෂරීආ නීති පද්ධතිය ආරක්ෂා කිරීම හා එයට පවතින බාධා තුරන්කිරීම යනුවෙන් අදිටන්කර ගැනීම.
- ●-ඉස්ලාමහි සැබෑ ප්‍රතිපත්තිය ව්‍යාප්ත කිරීම යනුවෙන් අදිටන්කර ගැනීම.

## 3-ආගම වෙළාගැනීම හා කුසල් කිරීම

අල්ලාහ් මෙසේ පවසන්නේය.

(ලාඉලාහ ඉල්ලල්ලාහ් යනු,) එක් ස්ථිර වචනය මගින් අල්ලාහ් විශ්වාස වන්තයින්ව මෙලෝ ජීවිතයේ හා පරලො

වෙහි ස්ථිර කරයි. අපරාධ කරුවන් (මවුන්ගේ පාප ක්‍රියා මගින්) මංමුළාවට පත් කරයි. අල්ලාහ් සිතන දෙය කරයි.
(අල්කුර්ආන්-14:27)

විශ්වාසවන්තයින් මෙලොවෙහි යහකම් හා කුසල් ක්‍රියාවන්හි යෙදීම කෙරෙහි අල්ලාහ් ස්ථිර කරයි. පරලොවෙහි එනම්, මිනීවළෙහි සුරදූතයන් දෙදෙනා මවුන් අමතා 'ඔබගේ ස්වාමියා කවරෙක්ද ?, ඔබගේ ආගම කුමක්ද ? ඔබගේ වක්තෘවරයා කවරෙක්ද ? යනුවෙන් ප්‍රශ්න කරන කළ නිවැරදිව පිළිතුරු සපයති. අල්ලාහ් මෙසේ පවසන්නේය.

මවුහු තමන්ට කළ උපදෙස් අනුව ක්‍රියා කරන්නේනම්, එය මවුන්ට ඉතා යහපතක් වශයෙන්ද, (සත්‍යයෙහි මවු-න්ට) තද ස්ථිර පැවැත්මක් වශයෙන්ද පවතී.
(අල්කුර්ආන්-4:66)

මෙය පැහැදිළිය. නොඑසේ නම්, විවිධ කරදර සිදුවන කළ යහකම් නොකර කම්මැළියෙන් සිටින්නන්ගෙන් ස්ථිර පැවැත්ම අපේක්ෂා කළ හැකිද ? නමුත්, කවරෙක් විශ්වාස කර, යහ කම්හි යෙදෙන්නේද, මවුන්ව ස්ථිර පැවැත්මට අල්ලාහ් පත් කරයි. මෙනිසා නබිනායක මුහම්මදු (සල්) තුමා යහකම් කිරීමෙහි නොකඩවා යෙදී සිටියේය. එතුමා, ස්වල්ප වුවද නොකඩවා කරන ක්‍රියාවන් ප්‍රිය කළේය.

## 4-වක්තෘවරුන්ගේ ඉතිහාසයෙන් ආදර්ශය ගැනීම

අල්ලාහ්ගේ වක්තෘ වරුන්ගේ ඉතිහාසය ඉගෙන ගෙන ඒවා ආදර්ශයට ගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

(ඔ : නබි,) ඔබගේ හදවත ස්ථිර පැවැත්මට පත්කිරීම සඳහා අපි ඔබට දූතයන්ගේ සංදේශ සියල්ල පැවැසුවෙමු. තවද, මේවාහි ඔබට සත්‍යයද විශ්වාසවන්තයින්ට දැනමුතු කම හා සිහිකිරීමද පැමිණ ඇත.

(අල්කුර්ආන්-11:120)

මෙවන් ඉතිහාස පවසන වැකි නබිනායක මුහම්මදු (සල්) තුමාගේ කාලයේ පහළවූයේ රසවිඳීමට හෝ නිශ්ප්‍රයෝජන යට ගැනීමට හෝ නොවේ. ඒවා පහළවූයේ නබිනායක තුමාගේ හදවත සහ මුස්ලිම් වරුන්ගේ හදවත් බලගතු කිරීමේ ඉමහත් අරමුණ මුල්කර ගෙනය.

## 5-ප්‍රාර්ථනා කිරීම

ආගම කෙරෙහි ස්ථිර පැවැත්ම ලබාදෙන ලෙස අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා කිරීම විශ්වාස වන්තයින්ගේ සත් ගුණාංග යකි. ආගමෙහි ස්ථිර පැවැත්ම ඇතිවීමට ප්‍රාර්ථනා කිරීම බලවත් හේතුවකි. මෙවන් සමහර ප්‍රාර්ථනාවන් මෙසේය.

رَبَّنَا لا تُزِغْ قُلُوبَنَا بَعْدَ إِذْ هَدَيْتَنَا (آل عمران:٨)

**රබ්බනා ලා තුසි(ග්)හ් කුලූබනා බ:ද ඉද් හදයිතනා**

අප ස්වාමිනි, ඔබ අපව යහමගෙහි යොමු කළායින් පසු අප හදවත් (එම යහමගෙන්) නොපෙරළනු මැනව.

(අල්කුර්ආන්-3:8)

رَبَّنَا أَفْرِغْ عَلَيْنَا صَبْراً وَثَبِّتْ أَقْدَامَنَا (البقرة:٢٥٠)

**රබ්බනා අෆ්රි(ග්)හ් අලෙයිනා සබ්රන් ව තබ්බිත් අක්දාමනා**

අපගේ ස්වාමිනී, ඔබ අපට ඉවසීම ලබා දෙනු මැනව. තවද, අප පාදයන් ස්ථිර කරනු මැනව.

(අල්කුර්ආන්-2:250)

නබිනායක මුහම්මදු (සල්) තුමා තම ප්‍රාර්ථනායේ පහත සඳහන් ප්‍රාර්ථනාව අධිකව සඳහන් කරන්නේය.

[يَا مُقَلِّبَ الْقُلُوْبِ ثَبِّتْ قَلْبِيْ عَلَى دِيْنِكَ] (رواه الترمذى)

**යා මුකල්ලිබල් කුලූබ්, තබ්බිත් කල්බී අලා දීනික**

හදවත් පෙරළ(ා පාරිශුද්ධ කර)න ස්වාමිනී, අප හද වත් ඔබ දහමෙහි ස්ථිර කරනු මැනව.

(මූලාශ්‍රය : තිර්මිදී)

# 6-අල්ලාහ් සිහිගැන්වීම

අල්ලාහ්ව අධික වශයෙන් සිහිගැන්වීම (භාවනා කිරීම) ස්ථිර පැවැත්මට මග පෙන්වන ඉමහත් කාර්යයකි. එය විශ්වාස වන්තයින්ගේ හදවත්හි ආධ්‍යාත්මික ගුණාංග උස් කිරීමෙහි ඉමහත් ප්‍රතිඵලය ඇති කරන්නේය. කවරෙක් හෝ අභිබවා යා නොහැකි තරම් අල්ලාහ් කෙරෙහි බල වත් සම්බන්ධයක් අල්ලාහ් සිහි ගැන්වීමෙහි පවතින්නේය.

# 7-ඍජු මාර්ගය අනුගමනය කිරීමට ආශාවීම

එකම ඍජු මාර්ගය පිළිපැදීමට මුස්ලිම්වරයා ආශාව දැක්විය යුතුයි. එනම්, අල්කුර්ආනය හා නබිනායක තුමා ගේ සුන්නා සංකල්පය වටහා දෙන පරිදි ආගම පැහැදිළිව දැනගත යුතු අතර, අනියම් ප්‍රතිපත්තීන් හා මංමුළාවට

පත්කරන චින්තනාවන් කෙරෙහි වැළකී සිටිය යුතුයි. නබි නායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් ඉර්බාල් බින් සාරියා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මගෙන් පසු ජීවත් වන්නන් නියතව, විවිධ මති මතාන්තර රැසක් දකිති. එකළ ඔබලා මාගේ මගද යහ මගෙහි ජීවත්වූ කලීෆා (ජනාධිපති)වරුන්ගේ මගද පිළිපැදිය යුතුයි. එනම්, මගේ යහමග සිය හකු දතෙන් හපා තදෙන් අනු ගමනය කරන්න. (ආගමික නාමයෙන්) අළුතින් බිහිවන කාර්යයන් ගැන මා ඔබලාට තරයේ අවවාද කරමි. නියතව, එසේ බිහිවන සැම කාර්යයන්ම බිද්අත් හෙවත් අමුතු චාරිත්‍රයන්ය. එවන් සැම බිද්අත් චාරිත්‍රයන්ම නොමගකි.

(මූලාශ්‍රය : අහ්මද්, අබූදාවූද්, තිර්මිදී හා ඉබ්නු මාජා)

## 8-පුහුණුව ලැබීම

විශ්වාසනීය පුහුණුව, චින්තනාත්මක පුහුණුව, හා ක්‍රමවත් පුහුණුව යනාදීන් ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමට මගපෙන්වන මූලික කාරණාවන්ය.

### අ)-විශ්වාසනීය පුහුණුව

මෙම පුහුණුව, අල්ලාහ් පිළිබඳව බියවීම, ඔහුගේ දයාව අපේක්ෂා කිරීම හා ඔහු ප්‍රියකිරීම යනාදීන් මගින් සිතට හා හෘද සාක්ෂියට පූර්ණ ජීවණයක් ලබා දෙයි.

### ආ)-චින්තනා පුහුණුව

මෙම පුහුණුව නිවැරදි සාධක මත මිනිසාව රඳවා තබන අතර, අස්ථිරතා ප්‍රතිපත්තීන් හා නිකරුනේ පිළිපැදීම වළක්වයි.

## ඉ)-ක්‍රමවත් පුහුණුව

මෙම පුහුණුව පෙර සූදානම් නොවීම, හදිසිවීම හා වැරදි සහගත මගෙහි ගමන් කිරීම යනාදියෙන් වළක්වා මුස්ලිම් වරයාට ඔහුගේ ශක්තිය හා හැකියාව අනුව ඍජු මාර්ගය ක්‍රමවත්ව පෙන්වයි.

මිනිසාට ඔහුගේ කුඩා අවධියේ සිට මෙවන් පුහුණුවේ යොදවීමට වග බලාගත යුතුයි. මක්නිසාද, මෙවන් පුහුණු ලත් තරුණයන් සාරවත් හදවතෙන් හා පවිත්‍ර ආත්මයෙන් සිටින බැවින්, සත් ගුණධර්ම හා ගුණාංග පිළිගැනීම එම හදවතට පහසුවේ.

ස්ථිර පැවැත්මෙහි මාර්ගයක්වූ පුහුණුව ලැබීමේ වැදගත් කම වටහාගැනීම සඳහා නබිනායක මුහම්මදු (සල්) තුමාගේ ජීවිතය කරා යා යුතුයි. මක්කාවෙහි සිය සතුරන්ගේ නොයෙක් දුෂ්කරතා හා පීඩාවන්ට ලක්වූ එතුමාගේ අනුගාමිකයින් ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමට මූලිකවූයේ කුමක්ද ? යැයි හදවතෙන් විමසා බැලිය යුතුයි. එතුමාගේ නබිත්වයේ ගැඹුරු පුහුණුවෙන් තොරව මවුන්ට මෙසේ ස්ථිර පැවැත්මක් ලැබීමට හැකිද ?

නබිතුමාගේ අනුගාමික (ක්)හබ්බාබ් ඉබ්නු අල් අරත් (රලි) තුමාගේ සිද්ධිය මෙයට නිදසුනකි. ඔහු සත්‍ය ආගම විශ්වාස කළ නිසා ඔහුගේ හාම්පුතුන් යකඩ කුරුවක් උණු වන තරමට ගිනියම් කර, එහි ඔහුව නිර්වස්ත්‍රයෙන් ඉසා දැමූහ. එම ගින්න නිවන තරමට ඔහුගේ පිට පැත්තෙන් මේදය උණුවී ගලා ඒමට පටන් ගත්තේය. මේ සියල්ල ඉවසා සිටීමට ඔහුට හේතුවූයේ කුමක්ද ?.

එසේම, නබිනායක තුමාගේ අනුගාමික බිලාල් ඉබ්නු රබාහ් (රලි) තුමාව උෂ්ණවත් වැලි ගොඩක (නිර්වස්ත්‍රයෙන්) තබා ඔහුගේ පපුව මත විශාල ගලක් තබා වේදනා කරන කළ ඔහු ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් ඉවසා සිටීමට හේතුවූයේ කුමක්ද ? සුමෙයා (රලි) තුමිය, ඇගේ ස්වාමියා හා පුත්‍රයා කුරිරු දඬුවමකට ලක්වූවත් එය ඉවසා ස්ථිර පැවැත්මෙන් සිටීමට හේතුවූයේ කුමක්ද ?

ගැඹුරු විශ්වාසයක් හා එය හදහත්හි තැන්පත් කරන (ස්ථිර පැවැත්මෙහි) ශක්තිමත් පුහුණුවක් ඔවුන්ට නොමැති නම්, ඔවුන්ට මෙවන් දඬුවම් ඉවසා ගෙන ආගම කෙරෙහි ස්ථිරභාවයෙන් සිටිය හැකිද ?.

## 9-මාර්ග පිළිබඳ ස්ථිරතාවය

මුස්ලිම්වරයා අනුගමනය කරන මාර්ගයේ නිවැරදිභාවය පිලිබඳ විශ්වාසය වැඩිවන කළ එකී ස්ථිරභාවය වැඩිවීමෙන් කිසියම් සැකයක් නොමැත. එයට අදාල සමහර මාර්ග මෙසේය.

- -මිනිසා ගමන් කරන මෙම යහමග, ඔහුට පෙර විසූ වක්තෘවරුන්, සත්‍යවන්තයින්, ආගමික විද්වතුන්, පරිත්‍යාග ශීලීන් හා යහපත් ශීලීන් ගමන් කළ සෘජු මග බව හැඟීම. එවිට ඔහුගේ තනිකම ඉවත්වී එය සමූහයක් බවට පත්වෙ. ඔහුගේ දුක් පීඩාවන් ඉවත්වී ඔහු සතුටට පත්වෙ. මක්නිසාද යත්, මෙම සැම දෙනා ඔහු ගමන් කරන මාර්ගයේ ඔහුගේ සහෝදරයින් බව ඔහුට හැඟේ.

- අල්ලාහ් අපව ඔහුගේ උතුම් නිර්මාණයක් ලෙස තෝරා ගෙන ඇති බව හැඟීම. අල්ලාහ් මෙසේ පවසන්නේය.

  (එහෙයින්, ඕ : නබි,) ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටම හිමි වේ. ඔහු තෝරා ගත් ඔහුගේ දාසයින්ට සාමය පහළ වනු මැනව. (අල්කුර්ආන්-27:59)

- අල්ලාහ් අපව අවිශ්වාස වන්තයින් ලෙස හෝ නූතන බිද්ආ කාර්ය කරා කැඳවන්නන් ලෙස හෝ පාපියෙක් ලෙස හෝ නිර්මාණය කළේනම්, අපගේ හැඟීම් කෙසේ පවතීද ?

- මිනිසාව උතුම් නිර්මාණයක් ලෙස තෝරා, ඔහුට නබි නායක මුහම්මදු (සල්) තුමා හා එතුමාගේ අනුගාමිකයින් අනුගමනය කළ ඍජු මාර්ගයේ ගමන් කිරීමේ වරම ලබා දීම, ඔහුව ඔහුගේ මාර්ගයෙහි ස්ථිර පැවැත්මට පත්කළ කාරණාවක් නොවන්නේද ?

# 10-කැඳවීමෙහි නිරතවීම

ආත්මය ක්‍රියා නොකරන්නේනම්, එය අපවිත්‍ර තත්වයට පත්වේ. එබැවින්, ආත්මය ක්‍රියාවට නැංවීමට උතුම් මාර්ගය අල්ලාහ් කරා කැඳවීමෙහි නියලීමකි. මෙය අල්ලාහ්ගේ රසූල් (දූත) වරුන් කළ උතුම් සේවයකි. ආත්මය අල්ලාහ්ට කීකරුවීමෙහි හා අවනතවීමෙහි අපි යොමු නොකළේනම්, එය අපව පාප ක්‍රියාවන් කරා යොමු කරයි.

කෙනෙකුගේ ඊමානය හෙවත් විශ්වාසය ඔහු කුසල් ක්‍රියාවන්හි නියලීමෙන් අධිකවන අතර, අකුසල්හි නිරතවීමෙන් එය අඩුවේ.

දහම පහදා දී ඒ කෙරෙහි ආරාධනා කිරීමේ කාර්යයට උතුම් කුලියක් ලැබෙන අතර, එය ස්ථිර පැවැත්මට තුඩු දෙන මාර්ගයක් වශයෙන්ද පවති. මක්තිසාද, යුද්ධයෙහි නියලී සටන් කරන්නාට ආරක්ෂාවක් අනවශ්‍යවේ. අල්ලාහ් කැඳවන්නන් සමග සිටින බැවින්, ඔහු ඔවුන්ගේ පාදයන් ස්ථිර පැවැත්මෙහි තහවුරු කොට ඔවුන්ගේ පාපයන් කමා කරයි. අල්ලාහ් කරා කැඳවන්නා, තම ඥානය හා හැකියාව මගින් ලෙඩ සමග සටන් කරන වෛද්‍යවරයෙකු සේය. මන්දයත්, අල්ලාහ්ගේ මගෙහි කැඳවන කාර්යයට ලැබෙන කුලිය ඉතාමත් අධිකය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

කවරෙක් අල්ලාහ් කරා (මිනිසුන්) කැඳවා (තමන්ද) යහකම් කර, සැබවින්ම මා (අල්ලාහ්ට කීකරුවූ) මුස්ලිම් වරුන් අතර කෙනෙකි යනුවෙන් පවසන්නේද, ඔහුට වඩා වචනයෙන් ඉතා සුන්දර වන්නයා කවරෙක්ද ?

(අල්කුර්ආන්-41:33)

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව සහ්ල් බින් සෑද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඔබ මගින් අල්ලාහ් කෙනෙකුට සෘජු මාර්ගය පෙන්වීම රතු පැහැති ඔටුවෙක් ඔබට ලැබීමට වඩා ඔබට හොඳය.

(මූලාශ්‍රය : බුහාරි)

## 11-ස්ථිර පැවැත්මට අදාල කාර්ය වෙළා ගැනීම

ස්ථිර පැවැත්මට අදාල මූලික කරුණුවල ස්වභාවය පිළි බඳව නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සමහර මිනිසුන් කුසල් ක්‍රියාවල යතුරු ලෙසද, අකුසල් ක්‍රියාවල යතුරු තහඩු (ඉබ්බන්) ලෙසද සිටින්නෝය.

(මූලාශ්‍රය : ඉබ්නු මාජා)

එබැවින්, සැබෑ ආගමික විද්වතුන් හා යහකම් කෙරෙහි උපදෙස් කරන සහෝදරයින් සොයා යාම හා මවුන් අනු ගමනය කිරීම ස්ථිර පැවැත්මට අදාල වැදගත් කරුණකි. යහපතුන්, ආදර්ශ වන්තයින් හා රැකබලා ගන්නන් යනාදි අප සහෝදරයින් අල්ලාහ්ගෙන් පසු අපි ගමන් කරන මාර්ගයෙහි උපකාර කරන්නන්ය. මවුහු අල්කුර්ආන් වැකි හා බුද්ධිය මගින් අපව ස්ථිර කරන්නෝය. එබැවින්, අපි මවුන් සමග ජීවත්වී මවුන් අනුගමනය කළ යුතුයි. අල්ලාහ් සිහි කෙරෙන සභාවල විශේෂත්වය දැනගැනීමට වෙහෙස දැරිය යුතුයි. එනිසා මවුන් සමග එක්ව සමූහයෙන් ජීවත්විය යුතු අතර, වෙන්වී තනිවම ජීවත්වීමෙන් වැළකී සිටිය යුතුයි. ව්‍යාඝ්‍රයා තනිව සිටින එළුවා ග්‍රහණය කරන සේ තනිව ජීවත් වන්නාව ෂාතාන්වරු නොමග යවති.

# 12-අල්ලාහ්ගේ උපකාරය

අල්ලාහ්ගේ උපකාරයද, අනාගතයඉස්ලාම් දහමටද බව ස්ථිරව විශ්වාස කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

අහෝ, විශ්වාස වන්තයිනි, ඔබලා අල්ලාහ්ට උපකාර කළේනම්, මහු ඔබලාට උපකාර කරයි. තවද, ඔබලාගේ පාදයන් (යහමගෙහි) ස්ථිර කරයි. (අල්කුර්ආන්-47:7)

නියත වශයෙන්ම, අල්ලාහ් විශ්වාසවන්තයින් (සතුරන් ගේ කරදර මවුන් කරා ළඟා නොවී) ආරක්ෂා කරයි.

(අල්කුර්ආන්-22:38)

තමා විශ්වාස කරන අයට අල්ලාහ් ආරක්ෂකයාය.
(අල්කුර්ආන්-2:257)

## 13-අසත්‍ය හා රැවටීම

අසත්‍ය කුමක් බව දැනගැනිම හා එමගින් රැවටීමෙන් වැළෙකීම අනිවාර්යවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

(මු : නබි, අල්ලාහ්ට) වෙනස්කම් කරන්නන් (සුපිරි වෙළඳුන් හා ධනවතුන් ලෙස ආඩම්බරයෙන්) නගරවල ගැවසීම ඔබව නොරවටත්වා. (එය) සුළු ආශ්වාදයකි. පසුව ඔවුන්ගේ රැඳුම් ස්ථානය අපායකි. එය ඉතා නපුරුම රැඳුම් ස්ථානයකි.
(අල්කුර්ආන්-3:196)

නොමගෙහි සිටින්නන් මෙලොවහි භුක්ති විඳින සතුට, ආශ්වාද හා ඔවුන් ගත කරන ආඩම්බර ජීවිතය කෙරෙහි විශ්වාස වන්තයා නොරැවටී සිටිය යුතුයි. මක්නිසාද, ඔවුන් ගේ ස්ථිර රැඳුම් ස්ථානය අපායවේ. මෙලෝ ආශ්වාද කලකින් ඉවත්වන හා විනාශවන දෙයකි. මෙය ස්වර්ගයේ අල්ලාහ් සැබෑ විශ්වාස වන්තයින් වෙනුවෙන් පිළියෙළ කර ඇති දේ හා සමග සසඳා බැලීමට නොහැක.

## 14-ගුණාංගයන් වර්ධනය කිරීම

ස්ථිර පැවැත්මට උපකාරවන ගුණාංග වර්ධනය කළ යුතුයි. මෙයින් මූලිකව පවතින්නේ ඉවසීමකි. මේ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ සරද් අල්කුද්රි (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඉවසීමට වඩා උතුම් හා විශාලවත් දායාදයක් කිසියම් කෙනෙකුට හෝ ලබා නොදෙන ලදී.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## 15–යහපතුන්ගේ උපදෙස් ලබාගැනීම

යහපතුන්ගේ උපදෙස් ලබා ගැනීමට උනන්දු විය යුතු අතර, එසේ ලැබෙන උපදෙස් වටහා ගෙන නිසියාකාරව ක්‍රියා කළ යුතුයි.

- පුද්ගලයෙක් ගමනක යෙදීමට පෙර, එම ගමනෙහි කිසියම් බාධාවක් සිදුවේ දැයි බියට පත්වන කළ ඒ ගැන උපදෙස් ලබාගත යුතුයි.
- කෙනෙක් පීඩාවකට ලක්වන කළ හෝ එය ලක්වන්නට පෙර හෝ ඒ පිළිබඳව උපදෙස් ලබා ගත යුතුයි.
- යම් තනතුරක් වෙනුවෙන් කෙනෙක් පත් කෙරෙන කළ හෝ හිමිකම් මගින් සම්පතක් හා මුදල් සම්භාරයක් ඔහුට ලැබෙනවිට ඔහු යහපතුන්ගෙන් උපදෙස් පැතිය යුතුයි.

තමා ස්ථිර පැවැත්මෙන් සිටිය යුතු අතර, අන් අයද එසේම ස්ථිර පැවැත්මෙන් සිටීමට වගබලා ගත යුතුයි. අල්ලාහ් විශ්වාස වන්තයින්ට ආරක්ෂකයා ලෙස සිටී.

## 16–ස්වර්ගය, අපාය හා මරණය සිහිකිරීම

මිනිසා ස්වර්ගයේ පිරී පවතින භාග්‍යයන් හා අපායයේ පවතින වේදනාවන් පිළිබඳව සිතා බැලිය යුතු අතර, මර ණය ගැනද සිහිකිරීම ඔහුට අවශ්‍යවේ. ස්වර්ගය සතුට හා

සැනසුම ගෙනදෙන ස්ථානයක් වන අතර, එය විශ්වාස වන්තයින්ගේ ගමනෙහි අවසානයකි. පරිත්‍යාග හා යහකම් නොකර සිටීමද, ස්ථිර පැවැත්මෙන් නොසිටීමද මිනිස් හද වතෙහි ස්වභාවයෙකි. නමුත්, මෙවන් ක්‍රියාවල යෙදීමෙන් ඔහු ගමන් කරන මාර්ගයෙහි සිදුවන දුෂ්කරථා හා අසීරුථා වන් සරලවීමේ අපේක්ෂාවක් පවතීනම්, ඔහුගේ හදවතෙහි ස්වභාවය යහපත් අතට පත්වේ.

එබැවින් ක්‍රියාවන්ට ලැබෙන කුලියෙහි වටිනාකම දැන සිටින්නාට එම ක්‍රියාවන්හි පවතින අසීරුතාවන් සරලවේ. එහෙයින්, ඔහු මෙවන් ක්‍රියාවල අඛණ්ඩව නිරතවී සිටී. ඔහු මේවාහි ස්ථිර පැවැත්මෙන් නොසීනම්, අහස් හා පොළොව ප්‍රමාණ විශාලමත් ස්වර්ගය තමාට නොලැබෙන බව වටහා ගනී.

එසේම, මරණය සිහි කිරීම මුස්ලිම් කෙනෙකු දහමෙන් ලිස්සා නොයා ආරක්ෂා කරයි. අල්ලාහ් නියමකළ සීමාවෙහි ඔහුව ස්ථිර කරයි. එකළ ඔහු එම සීමාව උල්ලංඝනය නොකරයි. මක්නිසාද, ඔහු තම ජීවිතයේ අවසන් මොහොත නව තප්පරයෙකින් පැමිණෙන බව දැන සිටියේ නම්, ඔහු දහමෙන් ලිස්සා යාමට හෝ අසත්‍යයෙහි මුරන්ඩුවෙන් සිටීමට හෝ ඔහුගේ හදවත කෙසේ උනන්දු කරයිද ? එනිසා නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඔබලා ආශ්වාදයන් නිශ්ඵල කරන මරණය, අධික වශයෙන් සිහි කරන්න.

(මූලාශ්‍රය : තිර්මිදී)

# ස්ථිර පැවැත්මෙහි අවස්ථාවන්

## 1-කරදරයෙහි ස්ථිරවීම

කරදර හා පීඩාවන් සිදුවන විට නොසැලී ස්ථිර පැවැත් මෙන් සිටීම හා ඉවසීමෙන් සිටිය යුතු දිනවල ස්ථිර පැවැත් මෙන් සිටීම ස්ථිර පැවැත්මට අදාල අවස්ථාවන්ය. ඉවසීමෙන් සිටිය යුතු දිනවල ස්ථිර පැවැත්මෙන් සිටින්නාට නබිනායක තුමාගේ අනුගාමික පනස් දෙනෙකුට ලැබෙන කුලියට සමාන කුලියක් ලැබෙන්නේය. එය කරදර හා පීඩාවන් සිදුවන අවස්ථාවල ස්ථිර පැවැත්මෙන් සිටීමේදී මහුට ලබන ඉමහත් කුලිය අගේකොට ගෙනය.

## කරදරයෙහි වර්ග :

### අ)-සම්පත් හා නිලතලෙහි කරදර

සම්පත් හා නිලතල හේතුවෙන් මිනිසාට සිදුවන කර දරවල අනතුර පිළිබඳව නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් කඅබ් බින් මාලික් අල් අන්සාරී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මිනිසෙක් ධනයට හා නිලතලයට තණ්හා වීම එළුවන් හමුවට එවන ලද කුසගින්නට පත් වෘකයන් දෙදෙනෙක් කරන විනාශයට වඩා ඔහුගේ දහමට ඉමහත් විනාශයක් ඇති කරයි.

(මූලාශ්‍රය : තිර්මිදී හා අහ්මද්)

මෙකී තේරුම 'එළුවන් හමුවට පැමිණි අධික කුසගින් නට පත් වෘකයන් දෙන්නෙක් ඔවුන්ට කරන විනාශයට

වඩා දරුණු විනාශයක් මිනිසා ධනයට හා නිලයට දක්වන තණ්හාව ඔහුගේ දහමට සිදු කරයි' යන්නේය.

## ආ)-බිරිඳ හා දරුවන්ගේ කරදර

බිරිඳ හා දරුවන්ගෙන් සිදුවන කරදර පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

අහෝ: විශ්වාස වන්තයිනි, නියතව, ඔබලාගේ බිරිඳන් හා ඔබලාගේ දරුවන් අතර ඔබලාට සතුරන්ද සිටිති. එනිසා මවුන් පිළිබඳව අවධානයෙන් සිටින්න.

(අල්කුර්ආන්-64:14)

## ඉ)-නින්දාව, අක්‍රමිකතාවය, දුෂ්ටකම හා ඉස්ලාමය වෙළාගැනීමට බාධා කිරීම යනාදි කරදර

## ඊ)-දජ්ජාල්ගේ කරදර

නබිනායක මුහම්මදු (සල්) තුමා අවසාන දිනයට සළකුණක් වශයෙන් පැමිණෙන දජ්ජාල්ගේ කලහ පිළිබඳව අනතුරු හඟවා ඇත්තේය. ඔහුගේ කලහයට ලක්වන කළ එවා කෙරෙහි ඉවසීමෙන් සිට දහම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටින ලෙසත්, ඔහුගේ හැකියාවෙන් ඔහු ප්‍රසිද්ධ කරන අපූර්ව කාර්යයන් කෙරෙහි නොරැවටන ලෙසත් අණ කර ඇත්තේය. මේ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අන්නවාස් බින් සම්ආන් (රළි) තුමා මෙසේ වාර්තා රන්නේය.

ඔබලාගෙන් කවරෙක් හෝ ඔහුව (දජ්ජාල) දුටුවෙනම්, ඔහු ඉදිරියෙහි සූරා කහ්ෆ් පරිච්ඡේදයේ ආරම්භ කොටස

පාරායනා කරන්න. ඉරාකය හා සිරියාව අතර ඇති මාර්ග යකින් පිටවන ඔහු තම දකුණු හා වම් ප්‍රදේශවල කෝලා හල ඇති කරයි. අල්ලාහ්ගෙ දාසයිනි, (එකළ ඔබලා ඔබලා ගේ ආගම කෙරෙහි) ස්ථිර පැවැත්මෙන් සිටින්න.

(මූලාශ්‍රය : ඉබ්නු මාජා)

දජ්ජාල්ගේ කරදරවලට නොරැවටී සිය ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් හා නිශ්චිත භාවයෙන් සිටින විශ්වාස වන්තයෙකු පිළිබඳ සැබෑ පුවතක් නබිනායක මුහම්මදු (සල්) තුමා උදාහරණයක් ලෙස තමන්ට පැවැසූ බව අබූ සර්ද් අල් කුද්රී (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

දජ්ජාල් පැමිණේ. ඔහුට මදීනා මාර්ගවල පිවිසීම තහ නම් කෙරේ. ඔහු මදීනාවේ ගොහොරු බිමෙන් (**Salt Marsh**) සිට බසී. එදින ඔහු වෙත යහපතෙක් පැමිණ 'ඔබ නබි නායක තුමා අපට වටහා දුන් දජ්ජාල් බව මා සාක්ෂි දරා කියමි' යැයි කියයි. එකළ ඔහු (තම අනුගාමිකයින් අමතා) 'මා මෙම පුද්ගලයාව ඝාතනය කොට පසුව ඔහුට ප්‍රාණය ලබා දුන්නේනම්, ඔබලා මාගේ මෙම කාර්ය කෙරෙහි සැක පල කරන්නෝද ?' යනුවෙන් විමසයි. එයට මවුහු සැක පල නොකරන බව කියති. පසුව දජ්ජාල් ඔහුව ඝාතනය කොට නැවත ඔහුට පණ පොවයි. නැවත පණ පෙවීමෙන් පසු ඔහු 'අල්ලාහ් මත දිවුරා කියමි. මෙය (මාව ඝාතනය කළ පසු නැවත ප්‍රාණය ලැබීම)ට වඩා මා ඔබ (නබිතුමා පැවැසූ) දජ්ජාල් බවට ඉතා පැහැදිළිව සිටින්නෙමි' යැයි පවසයි. එකළ දජ්ජාල් (ඔහුගේ අනුගාමිකයින් අමතා) 'මා ඔහුව ඝාතනය කරන්නද?' යනුවෙන් විමසයි. නමුත් ඔහුව ඝාතනය කිරීම ඔහුට නොහැකිවේ. (මූලාශ්‍රය : බුහාරි)

# 2-පිහාදයෙහි ස්ථිරවීම

සැබෑ විශ්වාස වන්තයින් අල්ලාහ්ගේ සතුරන් සමග යුද පිටියෙහි සටන් කරන කළ එහි නැගෙන කඩුවල ශබ්දය හා මරණය පිළිබඳ බිය මවුන්ට දහමෙහි ස්ථිර පැවැත්මෙන් සිටීම වර්ධනය කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

තවද, කොපමණ වක්තෘවරුන්, මවුන් සමග අල්ලාහ් ගේ යහපතුන් බොහෝ දෙනා එක්ව (අල්ලාහ්ගේ මාර්ගයෙහි) යුද්ධය කර ඇත්තෝය. නමුත්, අල්ලාහ්ගේ මාර්ගයෙහි (යුද්ධය කිරීමෙන්) තමන් ලක්වූ දුෂ්කරථාවන් නිමිත්තෙන් මවුහු අධෛර්යමත් නොවූහ. අසරණයට පත් නොවූහ. (සතුරන්ට) යටත් නොවූහ. අල්ලාහ් (මෙසේ දුෂ්කරථාවන් ඉවසා සිටින) ඉවසීලි වන්තයින් ප්‍රිය කරන්නේය. (මෙවන් අවස්ථාවල මවුහු තම ස්වාමියාගෙන්) 'අප ස්වාමිනී, අප පාපයන්ද, අපගේ ක්‍රියාවන්හි අපි සීමා ඉක්මවා ගිය වරදද ඔබ අපට කමා කරනු මැනව. අපගේ පාදයන් (යුද්ධයෙන් ඉවත් නොවන සේ) ස්ථිර කරනු මැනව. (ඔබ) ප්‍රතික්ෂේප කරන සමාජයට එරෙහිව (ජයග්‍රහණය අත්පත් කිරීම සඳහා) අපට උපකාර කරනු මැනව' යනුවෙන් මවුහු (ප්‍රාර්ථනාකර) පැවැසීම හැර (අන් කිසි දෙයක්) මවුන්ගේ කියමන් ලෙස නොපවතීය.

(අල්කුර්ආන්-3:146,147)

මෙසේ පිහාදයේ යෙදෙන මවුහු ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටින්නන්ය. බැලහීන විශ්වාස වන්තයින් සුළ ගට සැලෙන සේ මවුන් කිසියම් සුළඟට හෝ නොසැළී ධෛර්යමත්ව සිටිති. අල්ලාහ් මෙසේ පවසන්නේය.

මෙසේ ඔවුහු ජාලූත් හා ඔහුගේ හමුදාව සමග සටන් වැදීමට ඉදිරියට ගමන් කළ විට 'අප ස්වාමිනි, අපට ධෛර්-යය දී ආශීර්වාද කරනු මැන. අප පය තැබූ තැන ශක්ති මත් කරනු මැන. මිත්‍යාදෘෂ්ටික සතුරන් පරදවා අපට ජය ග්‍රහණය දෙනු මැන' යනුවෙන් ප්‍රාර්ථනා කළෝය.

(අල්කුර්ආන් - 2:250)

# 3-සැළසුමෙහි ස්ථිරවීම

සැබෑ විශ්වාස වන්තයා ඉස්ලාම් අනුශාසනාවන් ක්‍රියාත් මක කිරීමටද නූතන, අප්‍රයෝජන හා පාප ක්‍රියාවන් තුරන් කිරීමටද දැඩි ලෙස උනන්දුව දක්වයි. අල්ලාහ්ගේ අනුබල යෙන් ජයග්‍රාහික වන්තයා වීම සඳහා ඔහු නබි මුහම්මදු (සල්) තුමාගේ සුන්නා සංකල්පය අනුගමනය කරයි. ආග මට අදාල නොවන බිද්අත් නම්වූ නූතන කාර්යයන් කරා කැඳවන්නන් විශේෂයෙන් අද කාලයේ බහුල විය. ඔවුහු අල්ලාහ්ගේ ආගම සම්පූර්ණ ආගමක් බව නොදැනීමෙන් නූතන ක්‍රියාවන් ආගමික ක්‍රියාවන් හා සමග යා කරන් නෝය. එහෙයින්, මුස්ලිම් කෙනෙකු ආගමික නාමයෙන් ව්‍යාප්තවන නූතන ක්‍රියාවන් කෙරෙහි අවධානයෙන් සිටිය යුතුයි.

# 4-මරණ අවස්ථාවෙහි ස්ථිරවීම

අවිශ්වාස වන්තයින් හා පාපීන් කරදරවලට මුහුණ දෙන දුෂ්කර අවස්ථාවල ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටී මෙන් වැළකී සිටිති. එනිසා ඔවුහු මරණාසන්න මොහොතේ දී සාක්ෂි දැරීමේ ඒකත්ව වැකිය (කලිමාව) ප්‍රකාශ කිරීමට

අපහසු වෙති. මෙය අසතුටුදායක අවසානයේ සළකුණකි. නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව මුආද් බින් ජබල් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකුගේ අවසන් ප්‍රකාශය ලා ඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් පවතින්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ.

(මූලාශ්‍රය : අබූදාවූද්)

මෙසේ ප්‍රකාශ කිරීමේ භාග්‍ය අල්ලාහ්ගේ සැබෑ විශ්වාස වන්තයින්ට හැර අන් කවරෙකුට හෝ නොලැබේ. නපුරු අවසානයට සමහර උදාහරණ මෙසේය.

මිනිසෙක් ඔහුගේ මරණාසන්න මොහොතේදී 'ලාඉලාහ ඉල්ලල්ලාහ්' යන වැකිය ප්‍රකාශ කරන මෙන් අණකළ විට ඔහු තම හිස වමට හා දකුණට සොලවා එය ප්‍රතික්ෂේප කළේය. තවත් කෙනෙක් ඔහුගේ මරණාසන්න අවස්ථාවේ 'මෙය හොඳ දෙයක්. මෙය ලාභෙට ගත හැක යැයි කීය. තවැන්නා එම අවස්ථාවේ වෙස් ඉත්තන්ගේ නම් මතක් කළේය. සිව්වැන්නා රාගයන් තාලය කළේය හෝ ගීත වැකි ගායනා කළේය හෝ තම පැමිවතිය සිහි කළේය.

මෙවන් කාර්යයන්, ලොවෙහි ඔවුන් අල්ලාහ්ව සිහි කිරීමෙන් හා ඔහුට කීකරුවී වන්දනාමාන කිරීමෙන් වැළකීය. එනිසා ඔවුන්ට මරණාසන්න මොහොතේ මෙම වැකිය ප්‍රකාශ කිරීමේ වරම නොලැබීය. මෙවැන්නන් පිළිකුල් මුහුණුවරයකින් හෝ දුගඳ පිරිවරමින් හෝ පණ පිටවන අවස්ථාවේ කිබ්ලා දිසාවෙන් හැරමින් හෝ සිටිති. අල්ලාහ්ගේ අනුග්‍රහයෙන් තොරව කිසියම් යහකමක් කිරීමට හෝ අයහකමෙන් වැළකීමට හෝ කවරෙකුටද නොහැක.

නබිතුමාගේ සුන්නා සංකල්පය අනුගමනය කරන්නන්ට හා යහපතුන්ට අල්ලාහ් ඔවුන්ගේ මරණාසන්න සමයෙහි ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමේ වරම ලබා දෙයි. ඒ අනුව ඔවුහු එමොහොතේ ෂහාදා වැකිය පහසුවෙන් ප්‍රකාශ කරති. ඔවුන්ගේ යහපත් අවසානයේ සළකුණු එයින් ප්‍රසිද්ධවෙ. ප්‍රාණය පිටවන මොහොතේ ඔවුන් දීප්ති මත් මුහුණුවරකින් හෝ මිහිරි සුවඳ පිරිවරමින් හෝ ප්‍රීති යෙන් සිටිති. මක්නිසාද, මරණාසන්න මොහොතේ ෂහාදාව ප්‍රකාශ කරන්නාට ස්වර්ගය ලැබෙන බව අල්ලාහ්ගේ සුර දූතයන් සුභාසිංසනය කර ඇත්තේය. මෙවන් අය පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

නියතව, කවරෙක් තම ස්වාමියා අල්ලාහ් බව පවසා, පසුව (එය කෙරෙහි) ස්ථිරභාවයෙන් රැඳී සිටින්නේද, එවන් නන් වෙත (මරණාසන්න මොහොතේ) සුරදූතයන් පැමිණ '(පරලොව ගැන) ඔබලා නොබියවන්න. ඔබලා කණගාටු නොවන්න. ඔබලාට පොරොන්දුවූ ස්වර්ගය පිළිබඳව සුභා ශිංසනය ලබන්න' යනුවෙන් පවසති.

(අල්කුර්ආන් - 41:30)

තමන්ගේ ස්වාමියා අල්ලාහ් බව පිළිගෙන සිටින කව රෙක් හෝ ඒකදේවත්වයේ හා ඔවුන්ට අනිවාර්යව පවතින කාර්යයන්හි ස්ථිර පැවැත්මෙන් සිටියේනම්, ඔවුන්ගේ මර ණාසන්න මොහොතේදී ඔවුන් හමුවට පැමිණෙන අල්ලාහ් ගේ සුරදූත(මලක්)වරුන් 'මරණය ගැන හෝ එයට පසු පව තින කාර්යයන් ගැන හෝ බිය නොවන ලෙසත්, ඔවුන් ලොවෙහි අතහැර ආ බිරිඳ හා දරුවන් වැනි නියෝජිතයින් පිළිබඳව කණගාටු නොවන ලෙසත්, ඔවුන්ට නියෝජිතයින්

ලෙස ඔවුන් සිටින බවත්, ඔවුන්ට පොරොන්දුවූ ස්වර්ගය ඔවුන්ට ලැබෙන බවටවූ සුභාශිංසනය ලබා ප්‍රීතිවන ලෙසත් පවසති.

# ස්ථීර පැවැත්මෙට සමහර නිදසුන්

## 1-බිලාල් බින් රබාහ් (රලි) තුමා

එතියෝපියාවෙ වහලෙක්වූ බිලාල් (රලි) තුමා නබි නායක මුහම්මදු (සල්) තුමා විසින් සලාතයට කැඳවීම සඳහා පත්කළ ප්‍රථම මුඅද්දින් වරයෙකි. ඔහු නබිනායක තුමා ගැනද, එතුමාගේ ආගමික ප්‍රචාරය ගැනද දැනගත් විගස ඉස්ලාමය වෙළා ගත්තේය. වහාම මේ පිළිබඳව දැන ගත් ඔහුගේ හාම්පුතාවූ උමෙයා බින් ක්හලෆ් ආවෙශයට හා කෝපයට පත්විය. ඉස්ලාමය අතහැර නැවත තම පැරණි ආගමට පැමිණීම සඳහා ඔහු ඔහුට විවිධ වධ හිංසා කිරීමට පටන් ගත්තේය.

ඔහුට දැඩි ලෙස පහර දුන්නේය. කෑම බීම කිසිවක් නොදී ඔහුව උණුවන වැලි ගොඩක (නිර්වස්ත්‍රයෙන්) තබා ඔහුගේ පපුව මත විශාල ගලක් තැබුවේය. එනමුත් ඔහු 'අල්ලාහ් කෙනෙකි අල්ලාහ් කෙනෙකි' යැයි පවසමින්ම සිටියේය. ඔහුට දඬුවම උග්‍රවන තරමට ඔහු එසේම නැවත නැවත කියමින් සිටියේය. නොකඩවා වේදනා කිරීමෙන් උමෙයා විඩාවට පත්වන තෙක් වේදනා කළේය. නමුත්, බිලාල් (රලි) තුමා ඒවා ඉවසා ස්ථිර පැවැත්මෙන් සිටියේය. මෙය දුටු අබුබක්ර් (රලි) තුමා උමෙයා වෙත පැමිණ ඔහු ගෙන් බිලාල් (රලි) තුමාව මිළට ගෙන නිදහස් කළේය.

ඉස්ලාමය අතහැර පැරණි ආගමට පැමිණෙන මෙන් කුරිරු ලෙස වේදනා කළ උමෙයියා බද්ර් යුධ සටන් බිමේ දී බිලාල් (රළි) තුමාට මුහුණට මුහුණ හමුවිය. එහිදී එතුමාගේ අතින් ඔහු ඝාතනයට ලක්විය.

## 2-අම්මාර් බින් යාසිර් (රළි) තුමා

යෙමන් සිට මක්කාවට පැමිණ අම්මාර් බින් යාසිර් (රළි) තුමාගේ පියා හයියාත්ගේ දියණියවූ සුමෙයියා නම් ස්ත්‍රිය සමග විවාහවිය. එමගින් ඔවුන්ට අම්මාර් නම් පුත්‍රයෙක් ඉපදීය. පුංචි පවුලක්වූ ඔවුන් වහාම ඉස්ලාමය වෙළාගත්තෝය. මෙම හේතුවෙන් ඔවුහු බොහෝ කරදරවලට මුහුණ දුන්හ. ඔවුහු ඉස්ලාමය කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටි බැවින් විවිධාකාර වධ හිංසාවලට ලක්වූහ.

කිසිඳු ආහාරයක් හෝ පානයක් නොදී ඔවුන්ව මක්කා කාන්තාරයේ උණුවන තද ඉර අවවෙහි තැබූහ. කස පහර වලින් ඔවුන්ගේ දේහ පොඩිපට්ටම් විය. ඔවුන්ගේ පපුව මත විශාල ගල් තැබූහ. නමුත් මෙවන් වේදනා හේතුවෙන් ඔවුන් සිය ආගම අතහැර නොගිය අතර, ඔවුන්ගේ ස්ථිර පැවැත්ම වර්ධනය වන්නට විය. මෙවන් කුරිරු වේදනාවට ලක්වූ අම්මාර්ගේ මව සුමෙයියා (රළි) තුමිය ජීවිතක්ෂයට පත්වූවාය. එමගින් ඇය ඉස්ලාමය වෙනුවෙන් සිය දිවි පුද කළ ප්‍රථම කාන්තාවක් බවට ඉතිහාස ගතවූවාය.

නොකඩවා වේදනාවට ලක් කළත් අම්මාර්ගේ හා ඔහුගේ පියාගේ ඉවසීලිභාවය හා ඔවුන් හදවත්තුල පැවැති ස්ථිර පැවැත්ම ඉදිරියේ කුරෛෂිවරුන්ට ඔවුන්ව අතහැරීම හැර වෙනත් මාර්ගයක් නොවිය. අම්මාර් (රළි) තුමාගේ

දානය කිරීමේ ගුණාංග හා සත්‍යභාවයෙහි ස්ථිරව සිටීමේ ඔහුගේ හැකියාව අගය කළ නබිනායක මුහම්මදු (සල්) තුමා එතුමාට අධික වශයෙන් ආදරය කළේය.

## 3-මුස්අබ් බින් උමෙර් (රලි) තුමා

ධනවත් හා සෞන්දර්යමත් තරුණයෙක්වූ මුස්අබ් බින් උමෙර් (රලි) තුමා හිතු මනාපය පරිදි ධන මානයෙන් හා අධික භාග්‍යයෙන් සැපවත් ජීවිතයක් ගත කළේය. නබිනායක මුහම්මදු (සල්) තුමා ගැනත්, අල්ලාහ්ට පමණක් වන්දනමාන කිරීම හා ඔහු හැර අන් අයට කරන වන්දනා මාන තුරන් කිරීම කෙරෙහි මිනිසුන් කැඳවන්නෙකු වශයෙන් අල්ලාහ් එතුමාව එවා ඇති බවත්, අර්කම් (රලි) තුමාගේ නිවසෙහි එතුමා සිය අනුගාමිකයින් රැස්කර මවුන්ට කුර්ආනය පාරායනා කොට නව ආගමක් උගන්වන බවත් මක්කා වැසියන් මාර්ගයෙන් ඔහු ආරංචිවිය. මවුන් හමුවට ගොස් මෙම නබිවරයා කැඳවන දෙය කුමක්දැයි විමසා බැලීමට ඔහු දිනක් සවස්වරුවෙ අධිටන් කළේය. එහි ගිය ඔහු අල්කුර්ආනයේ වැකි සවන් දීමටත් පෙර ඔහුගේ හද වතෙහි අල්ලාහ් කෙරෙහි විශ්වාසය උදාවිය.

එහිදී ඉස්ලාමය වෙළා ගත් ඔහු එය රහසිගතව පවත්වාගෙන යාමට අදහස් කළේය. මන්ද, ඔහුගේ මව ඔහුට දක්වන අසීමිත ආදරය සහ ඔහු ඇයට දක්වක ඉමහත් ගෞරවය හේතුවෙන් මෙමගින් ඇගේ හදවත වේදනා නොකිරීමට ඔහු වගබලා ගත් නිසාය. මේ හැර කුරෛෂිවරුන් කෙරෙහි පවතින බියට නොවන්නේය.

අර්කම් (රලි) තුමාගේ නිවසෙහි රහස්වත නබිනායක තුමා හා එතුමාගේ අනුගාමිකයින් හමුවට ඔහු නැවත නැවත යාමට පටන් ගත්තේය. දිනක් මෙසේ එම නිවසට පිවිසීම දුටු කුරෙෂ් වරයෙක් ඒ බව වහාම ඔහුගේ පියාට දැනුම් දුන්නේය. මෙයට ප්‍රති ක්‍රියාවක් වශයෙන් ඔහුගේ මව ඔහු ඉස්ලාමය අතහැර පැරණි ආගමට නැවත ඒවි යන අරමුණෙන් ඔවුන්ගේ නිවසෙහි එක් කාමරයක ඔහුව සිර කළාය. නමුත්, මෙමගින් ඉස්ලාමය අනුගමනය කිරී මත් ඒ කෙරෙහි ස්ථිර පැවැත්මෙන් සිටීමත් ඔහුට වර් ධනය විය.

කාමරයෙහි සිරගතව සිටි ඔහු එයින් පිටවූ හෙයින්, ඔහුගේ මව ඔහුට ආහාරපාන, ඇඳුම් පැළඳුම් හා මුදල් යනා දීන් ලබා දීම අත්හිටුවාය. මෙනිසා ධනවත් තරුණයෙක්වූ ඔහු ඉරී අණ්ඩ දැමූ ඇඳුම් අඳින දිළින්දෙක් බවට පත්විය. ඔහු ඉස්ලාමය වෙළා ගන්නා මෙන් සිය මවට ආරාධනා කළේය. නමුදු, එය ප්‍රතික්ෂේප කළ ඔහුගේ මව තමා කිසි යම් දිනක හෝ ඉස්ලාමය වෙළා නොගන්නා බව දිවුරා ප්‍රකාශ කළාය.

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ හදවතෙහි මුස්අබ් (රලි) තුමා පිළිබඳව ඉමහත් ස්ථානයක් පැවැතී බැවින්, මදීනා වැසියන් ඉස්ලාමය කරා කැඳවා ඔවුන්ට ඉස්ලාමය පිළිබඳව ඉගැන්වීම සඳහා ඔහුව මදීනාවට පිටත් කළේය. ඔහු මදීනාවට ගිය අවස්ථාවේ එහි මුස්ලිම්වරුන් දොළොස් (12) දෙනෙක් පමණක් සිටියහ. එනමුත්, මාස කීපයකින් පසු අල්ලාහ්ගේ අනුබලයෙන් මදීනා වැසියන් සැම දෙනා ඔහුගේ කැඳවීමට සවන්දී ඉස්ලාමය වෙළා ගත්හ.

උහද් යුද්ධයට සහභාගිවූ ඔහු තමාගේ එක් අතකින් කොඩියද අනෙක් අතකින් කඩුවද ඔසවාගෙන වීර ආවේශ යෙන් සටන් කළේය. අධික වශයෙන් සහභාගිවූ සතුරන් ඔහුට පහර දෙන්නට පටන් ගත්හ. ඔවුනතර කෙනෙක් සිය කඩුවෙන් ඔහුගේ අතක් කපා දැම්මේය. වහාම ඔහු කොඩිය අනෙක් අතකින් ඔසවාගෙන සටන් කළේය. ඔහු තමාව රැකගැනීම සඳහා අවධානයෙන් සිටි කළු සතුරෙකු ගේ වෙනත් කඩු පහරකින් ඔහුට ඔහුගේ අනෙක් අතද අහිමිවිය. වහාම ඔහු තමාගේ උරහිස දෙකෙන් තදකොට කොඩිය ඔසවා ගත්තේය.

පසුව එම සතුරා එවූ ර්තල පහරක් මුස්අබ් ඉබ්නු උමෙර්ගේ පපුවට වැදීමෙන් ඔහු පොළොවෙහි වැටීය. කොඩියද එසේම වැටීය. මෙය දුටු නබිනායක මුහම්මදු (සල්) තුමා පහත සඳහන් අල්කුර්ආන් වැකිය පාරායනා කළේය.

විශ්වාස වන්තයින් අතර සමහර පිරිමින් සිටින්නෝය. ඔවුහු කුමණ දෙය ගැන අල්ලාහ්ට පොරොන්දුවූයේද, එය ඔවුන් සත්‍ය කළෝය.

(අල්කුර්ආන්-33:23)

## 4-උම්මු ෂරීක් (ගස්යා බින්ත් ජාබිර්) (රලි) තුමිය

ගස්යා බින්ත් ජාබිර් (රලි) තුමිය ඉස්ලාම් දහම වෙළා ගත් පුවත දැනගත් ඇගේ ස්වාමි පුරුෂයාගේ පවුල් ඥාතීන් 'ඔබව උග්‍ර වේදනාවකට ලක් කරන්නෙමු' යනුවෙන් කීහ. පසුව සිදුවූ දේ ගැන ඇය මෙසේ පවසන්නීය.

අප නිවසින් මාව එළියට රැගෙන ඔවුන් වෙත තිබූ නපුරු ඔටුවෙක් මත මාව නංවාගත් ඔවුහු මාහට රොටි හා මීපැණි ස්වල්පයක් පමණක් ලබා දුන් අතර, බීමට ජල බිංදුවක් හෝ නොදුන්නේය. මෙසේ දහවල් ඉර මුදුන් වේලාව පැමිණ ඉර අවවට දැවෙන තෙක් ගමන් කළෙමු. පසුව ඔවුන් බැස කුඩාරමක් ගසා එහි හිඳ ගත්තෝය. මාව පමණක් උෂ්ණමත් ඉර අවවෙහි තැබූහ. මෙයින් මාගේ කල්පනා කිරීමේ, බැලීමේ හා ශ්‍රවණය කිරීමේ හැකියා ඉවත්වන තත්ත්වයට පත්වීමි. මෙසේ දින තුනක් ගතවිය. තෙවැනි දින ඔවුහු 'ඔබ පිළිගෙන සිටින ආගම අතහරින්න' යැයි මාහට කීහ. (ඔවුහු යමක් කියන බව ඇය දැන සිටි නමුත්, ඔවුන් කියන දෙය පැහැදිළිව දැන නොසිටියාය.) එවිට මා ඒක දේවත්වය තහවුරු කරමින් මාගේ ඇඟිල්ලක් අහස කරා සංඥා කළෙමි. මා අල්ලාහ් කෙරෙහි දිවුරා කියමි. මා අසීමිත වේදනාවට පත්ව සිටි යත් මා පිළිගත් ආගම කෙරෙහි ස්ථිරභාවයෙන් සිටියෙමි. එකළ ශීතල ජලයෙන් යුත් බාල්දියක් මාගේ පපුව මත තිබීම දුටු මා වහාම එයින් හුස්මක් පානය කළෙමි. පසුව මාගෙන් ඉවත්වූ එය අහස් හා පොලොව අතර එල්ලමින් පවතීම දිටිමි. එනිසා එයින් නැවත පානය කිරීමට නොහැකි විය. පසුව දෙවැනි වතාවටත් එය මා වෙත පැමිණිය. එයින් මා හුස්මක් පානය කළ පසු එය මගෙන් ඉවත් විය.

පසුව එය අහස් හා පොලොව අතර එල්ලමින් පවතීම දුටුවෙමි. එනිසා එයින් නැවත පානය කිරීමට නොහැකිවිය. පසුව තෙවැනි වතාවටත් එය මා වෙත පැමිණිය. එයින් මා කුස පිරෙන තෙක් පානය කළ පසු මාගේ හිසේ, මුහුණේ

හා ඇඳුමෙහි ජලය වැක්කළෙමි. මෙවා සියල්ල දුටු මවුන් එතැනින් පිටත්වූහ. පසුව මවුන් මාව අමතා 'අල්ලාහ්ගේ සතුරනී, මෙය ඔබට ලබා දුන්නේ කවරෙක්ද ?' යනුවෙන් විමසූහ. එයට ඇය 'අල්ලාහ්ගේ සැබෑ දහමට වෙනස්කම් කරන්නා මාහට වඩා ඔහුගේ සතුරාය. මෙම ජලය ලබා දුන්නේ කවරෙක් බව ඔබලා විමසුවෝය. එය අල්ලාහ්ගෙන් මට ලැබූ දායාදයෙකි' යනුවෙන් පැවැසූවාය. වහාම මවුහු තමන් රැස්කර තැබූ හම් භාජනය පරීක්ෂා කර බැලූහ. එය එලෙසම නොවිවෘතව බැඳ වසා තිබීම දුටු මවුන් ඇය අමතා 'ඔබ විශ්වාස කළ ස්වාමියා අපගේද ස්වාමියා බව සාක්ෂි දරන්නෙමු. අපි ඔබට මෙවන් වධ හිංසා කළ පසුද ඔබට ජලය ලබා දුන්නේ සැබැවින්ම ඔහුමය. ඉස්ලාමය ආගමක් වශයෙන් පිරිනැමුවේද ඔහුමය' යැයි පැවැසූහ. පසුව ඉස්ලාමය වැළඟත් මවුන් සැම දෙනා නබිනායක මුහම්මදු (සල්) තුමාගේ හමුවට ගියෝය. මවුන්ට වඩා මාහට පවතින ශ්‍රේෂ්ඨත්වය හා අල්ලාහ් මාහට කළ උප කාරය ගැන මවුහු දැන ගත්තෝය.

ඕ ! අප ස්වාමිනි,
ආගම කෙරෙහි ස්ථිර පැවැත්මෙන්
සිටීමේ වරම ලබා දෙනු මැනව
අප සැමට...

# පටුන

**✱-ස්ථිර පැවැත්මෙහි මාර්ග ..................................................-10**

1-කුර්ආනය කරා ළඟාවීම
2-දැනුම
3-ආගම වෙළා ගැනීම හා කුසල් කිරීම
4-වක්තෘවරුන්ගේ ඉතිහාසයෙන් .....
5-ප්‍රාර්ථනා කිරීම
6-අල්ලාහ් සිහිගැන්වීම
7-ඍජු මාර්ගය අනුගමනය කිරීමට ආශාවීම
8-පුහුණුව ලැබීම
9-මාර්ග පිළිබඳ ස්ථිරතාවය
10-කැඳවීමෙහි නිරතවීම
11-ස්ථිර පැවැත්මට අදාල කාර්යයන්
12-අල්ලාහ්ගේ උපකාරය
13-අසත්‍යය හා රැවටීම
14-ගුණාංගයන් වර්ධනය කිරීම
15-යහපතුන්ගෙන් උපදෙස් ලබා ගැනීම
16-ස්වර්ගය, අපාය හා මරණය සිහිකිරීම

**✱-ස්ථිර පැවැත්මෙහි අවස්ථාවන් ........................................- 25**

1-කරදරයෙහි ස්ථිරවීම
2-ජිහාදයෙහි ස්ථිරවීම
3-සැළසුමෙහි ස්ථිරවීම
4-මරණ අවස්ථාවෙහි

**✱-ස්ථිර පැවැත්මෙට සමහර නිදසුන් ..................................-32**

1-බිලාල් බින් රබාහ් (රලි) තුමා
2-අම්මාර් බින් යාසිර් (රලි) තුමා
3-මුස්අබ් බින් උමෛර් (රලි) තුමා
4-උම්මු ෂරික් (රලි) තුමිය

طبعت بمطابع دار طيبة ـ الرياض السويدي
شارع عبدالملك بن هشام ـ ت : ٤٢٨٣٨٤٠